# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය දෙවන වාරය

## සුදුසු පිළිතුර වරහන් තුළින් තොරා හිස්තැන් පුරවන්න

1. බුදුරජාණන් වහන්සේ විසින් ....................නම් තරුණයෙකු හට නිවැරදි දිශා නමස්කාරය පැහැදිලි කරමින් ගිහි විනය අන්තර්ගත .............................සූත්‍රය දේශනා කළසේක.
2. බ්‍රහ්මයන් තුළ පවතින මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් දෙමාපියෝ යුක්ත බැවින් ඔවුන් .....................යන නමින් ද හඳුන්වයි.
3. දරුවන් පාසල් අධ්‍යාපනය ලැබීමට පෙර දැනගතයුතු බොහෝ දේ දෙමාපියන් විසින් උගන්වනු ලබන බැවින් දෙමාපියෝ ......................යන නමින් ද හඳුන්වති.
4. ගුරුවරුන්ගේ අවවාද අනුශාසනා වලට මැනවින් ඇහුම්කන් දීම ................ගේ යුතුකමකි.
5. යහපත් මිත්‍රයන් ......................ලෙසත් ව්‍යාජ මිත්‍රයන් ......................ලෙසත් බුදු දහම තුළ හඳුන්වා ඇත.
6. බුදු දහමේ ගිහි පක්ෂය ....................ලෙස ද පැවිදි පක්ෂය .....................ලෙස ද හඳුන්වයි.

**(බ්‍රහ්ම, උපාසක උපාසිකා, ශිෂ්‍යයා, කල්‍යාණ මිත්‍රයන්, පුබ්බාචරිය, භික්ෂු භික්ෂුණී, සිගාල, මිත්‍ර ප්‍රතිරූපකයන්, සිගාලෝවාද )**

## පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසාවන්ට අයත් සමාජ කණ්ඩායම් නම් කරන්න.
2. සිගාලෝවාද සූත්‍රයෙහි ගුරුවරුන් දකුණු දිශාවට සමාන කොට දක්වා ඇත්තේ කුමන හේතු නිසාදැයි පැහැදිලි කරන්න.
3. දෙමාපියන් හා දරුවන් තම යුතුකම් නිසි කල නිසි ලෙස ඉටුකිරීම තුළින් එම දෙපිරිසට ම සිදුවෙන යහපත සිගාලෝවාද සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.
4. පවුලේ සාමයත් සතුටත් දියුණුවත් දූ දරුවන්ගේ යහපතත් සැලසෙන්නේ අඹු සැමියන්ගේ යහපත් පැවැත්ම මතය. මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.
5. යහපත් ශිෂ්‍ය ජීවිතයක් ගත කිරීමට කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.